# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2158/6 - 2020 ජනවාරි මස 13 වැනි සඳුදා - 2020.01.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(5) වැනි ව්‍යවස්ථාවට අනුකූලව හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 52(1) යටතේ පත් කරන ලද තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අමාත්‍යාංශයේ ලේකම්වරයා ප්‍රධාන ගණන් දීමේ නිලධාරි වශයෙන් කටයුතු කරන අතර, 2019 දෙසැම්බර් මස 10 දිනැති අංක 2153/12 *අති විශේෂ ගැසට්* පත්‍රය ප්‍රකාරව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අමාත්‍යවරයා වශයෙන් මා වෙත පැවරී ඇති පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් කාර්යයන් හා කර්තව්‍යයන්, දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ රාජ්‍ය අමාත්‍යවරයා වන ලක්ෂ්මන් යාපා අබේවර්ධන වෙත මෙම නිවේදනයේ දිනයේ සිට පවරන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආචාර්ය බන්දුල ගුණවර්ධන,
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අමාත්‍ය.

2020 ජනවාරි මස 09 වැනි දින.

**උපලේඛනය**

*I වැනි තීරුව*
*කාර්යයන් හා කර්තව්‍යයන්*

1. ජනතාවගේ නිවැරදි තොරතුරු දැනගැනීමේ අයිතිය තහවුරු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ගයන් ගැනීම.

*II වැනි තීරුව*
*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*

1. ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
2. ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය

*III වැනි තීරුව*
*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණපනත්*

1. ඇසෝසියේටඩ් නිවුස්පේපර්ස් ඔෆ් සිලෝන් ලිමිටඩ් (විශේෂ විධිවිධාන) පනත (1973 අංක 28)

.

*උපලේඛනය (සම්බන්ධිතයි)*

*I වැනි තීරුව*
*කාර්යයන් හා කර්තව්‍යයන්*

2. ජනතා ආකල්ප යහපත් මානයන් කරා කේන්ද්‍රගත කරමින් ආර්ථික, සමාජීය, සංස්කෘතික හා දේශපාලනමය ක්ෂේත්‍රයන්හි ප්‍රගමන කාරකයක් ලෙස ජනමාධ්‍යයෙහි දායකත්වය ලබා දීම සඳහා අවශ්‍ය ක්‍රමෝපායයන් සම්පාදනය කිරීම.

3. රාජ්‍ය නිල නිවේදන හා ප්‍රවෘත්ති නිකුත් කිරීමට අදාළ රාජ්‍ය ආයතන මනා සම්බන්ධීකරණයක් තුළ ජනතාව දැනුවත් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

4. ශ්‍රී ලංකාව පිළිබඳ අදාළ තොරතුරු දේශීය හා විදේශීය ජනමාධ්‍ය ආයතනවලට නිකුත් කිරීම.

5. විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට අවශ්‍ය තොරතුරු හා ප්‍රචාරක සේවා සැපයීම.

6. ප්‍රකාශනවලට අදාළ ජාත්‍යන්තර ගිවිසුම් හා සම්මුතීන් ක්‍රියාත්මක කිරීම.

7. නවතම තාක්ෂණය සහ කළමනාකරණ ක්‍රමවේදයන් භාවිත කරමින් විවිධත්වය තුළින් ව්‍යාපාර අරමුණු කර ගත් නවීන තැපැල් සේවයක් ලබා දීම සහ දේශීය හා විදේශීය තැපැල් සේවා කටයුතු කාර්යක්ෂම ලෙස පවත්වාගෙන යාම.

8. වෙනත් දෙපාර්තමේන්තු සඳහා නියෝජිත ගෙවීම් කටයුතු සිදු කිරීම.

9. ලංකා මුද්දර කාර්යාංශය පරිපාලන කිරීම.

*II වැනි තීරුව*
*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*

3. සීමාසහිත ලංකා එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම

4. සීමාසහිත ලංකා පුවත් ආයතනය

5. මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි-සිනමා උද්‍යානය (රන්මිනිතැන්න)

6. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

7. තැපැල් දෙපාර්තමේන්තුව

*III වැනි තීරුව*
*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණපනත්*

2. ප්‍රවෘත්ති පත්‍ර ආඥාපනත (1839 අංක 5)

3. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත (2016 අංක 12)

01-654

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.